Australian Government

Department of Home Affairs

# ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාම

මෙම පිටුවෙහි ඇති දේ

[පුරවැසියන් නොවන අය](#)

[සිය මව්බිම බලා නැවත යන තාවකාලික විසා බලපත්‍රධාරීන්](#)

[ඕස්ට්‍රේලියානු පුරවැසියන් සහ ස්ථිර නේවාසිකයන්](#)

ඕස්ට්‍රේලියානු ප්‍රජාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව සතුව දැඩි දේශසීමා ක්‍රියා මාර්ග ඇත. ඕස්ට්‍රේලියාවේ සිට සහ ඕස්ට්‍රේලියාව වෙත ඉතා සීමිත ගුවන් යානා දැනට ඇති අතර මෙම කාලයේදී ඔබට විදේශ ගමන්වල නිරතවීම කල නොහැකි විය හැකිය. බලන්න: ජාතික කැබිනට් මාධ්‍ය ප්‍රකාශනය.

ඕස්ට්‍රේලියානු පුරවැසියන් ඇතුළුව ඕස්ට්‍රේලියාවට පැමිණෙන සියළු අයව හෝටලයක, තමා පැමිණෙන ගුවන්තොටුපල වැනි ස්ථානයක දින 14 ක අනිවාර්ය නිරෝධායනයකට යටත් විය යුතුය. ගමන් කරන අය සඳහා කොරෝනා වයිරස් (කෝවිඩ්-19) උපදෙස් බලන්න. නිරෝධායනය සඳහා යන වියදම ඔබ විසින් ගෙවීම අවශ්‍ය විය හැකිය. නිරෝධායන අවශ්‍යතා සඳහා අදාල ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයේ සෞඛ්‍යය දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන්න.

## පුරවැසියන් නොවන අය

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන්හි ඇති දේශසීමා ගමන් සීමා, ව්‍යාපාර වසා දැමීම සහ සමාජ දුරස්ථභාවය සම්බන්ධ අවශ්‍යතා ඇතුළු දැනට කෝවිඩ්-19 හේතුවෙන් ඕස්ට්‍රේලියාවේ ඇතිවී තිබෙන තත්වය හේතුවෙන්, සියළු විදේශ සංචාරකයන් රටින් පිටත්ව යා හැකිනම් එසේ පිටවන ලෙස උනන්දු කෙරේ.

තාවකාලික වීසා බලපත්‍රධාරීන් විසින් ඕස්යෙට්‍රිලියාවට නැවත පැමිණීමට අදහස් කරයි නම්, කෝවිඩ්-19 සීමා ඇති අතර සාමාන්‍ය වශයෙන් ගමන් කිරීම සම්බන්ධයෙන් ඇති බැහැර කිරීමකට ඉල්ලා සිටිය යුතුය. කොමසාරිස්වරයා විසින් ලබාදෙන බැහැර කිරීම් සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා ඕස්ට්‍රේලියාවට පැමිණීම බලන්න.

## සිය මව්බිම බලා නැවත යන තාවකාලික විසා බලපත්‍රධාරීන්

සිය රටෙහි දේශසීමා සීමා මගින් ඉඩ ලබා දෙන්නේනම්, කෝවිඩ්-19 හේතුවෙන් බලපෑමකට ලක්වුණු තාවකාලික වීසා බලපත්ධාරීන් විසින් සිය මව්බිම බලා යාමට කටයුතු පිළියෙල කරගත හැකිය.

තාවකාලික වීසා බලපත්‍රධාරීන් විසින් සිය මව්බිමට යාම සඳහා බැහැර කිරීමක් අවශ්‍ය නොවේ. සිය මව් බිමෙහි දේශසීමා සීමා අනුව සිය මව්බිමට යාමට ඉඩ ලැබෙන තාක් දුරට ඔවුන් විසින් ඕනෑම අවස්ථාවක නැවත යාම සිදුකල හැකිය.

කෝවිඩ්-19 තත්වය දිගින දිගටම වෙනස් වෙමින් පවතින බවට මතක තබා ගන්න.

සෑම සතියකම පහත දේ පරීක්ෂාකර බලන්න:

- දේශසීමා සීමා
- ගුවන්යානා ඇතිද යන බව

ඕස්ට්‍රේලියාව පුරා ඇති ප්‍රධාන ගුවන් තොටුපලවල වාණිජ ගුවන් යානා ඇත. මෙම ගුවන් සමාගම් දැනට ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යන ගුවන් යානා පියාසර කරයි:

පියාසර කරන ගුවන් සමාගම් අතර ඇත්තේ: AirAsia | Air New Zealand | China Airlines | China Southern Airlines | Emirates | Malaysia Airlines | SriLankan Airlines | Qatar Airways | United

ඔබගේ මව් බිම වෙත යන පුද්ගලික හෝ රජය මගින් ක්‍රියාත්මක වන සිය මව්බිමට රැගෙන යන ගුවන් යානා ඇතිදැයි සොයා බලන්න.

ඉන්දියාව මගින් දැනට සිය මව්බිමට රැගෙන යන ගුවන් යානා පිළියෙල කරමින් සිටී.

ඔබට සිය මව්බිමට යාම සම්බන්ධ වැඩිදුර උපකාර අවශ්‍යනම්, ඕස්ට්‍රේලියාවේ තිබෙන ඔබගේ තානාපති කාර්යාලය හෝ කොනසියුලේට් කාර්යාලය සමග සම්බන්ධ වන්න.

ඔබගේ තොරතුරු ලියාපදිංචි කිරීම ද කල හැකිය.

ඔබගේ තොරතුරු අප විසින් විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන අතර, ඒ මගින් මෙම තොරතුරු ඔබගේ රජය වෙත ලබාදෙනු ඇත (විදේශයේ, හෝ තානාපති කාර්යාලයේ නියෝජනය, කොන්සියුලේට් කාර්යාලය, හෝ ඕස්ට්‍රේලියානු මහා කොමසාරිස් කාර්යාලය).

මෙම සේවාව තාවකාලික වීසා බලපත්‍රධාරීන් සඳහා පමණි.

## ඕස්ට්‍රේලියානු පුරවැසියන් සහ ස්ථිර නේවාසිකයන්

ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ ස්ථිර නේවාසිකයෙකුනම්, ඔබ විසින් ලබාගත් බැහැර කිරීමක් නැතිනම්, කෝවිඩ්-19 හේතුවෙන් ඔබට ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා නොහැක. මේ සඳහා ඔබ විසින් මාර්ගගතව අයදුම්කල හැකි අතර පහත අවශ්‍යතාවයන්ගෙන් එකක් හෝ සපුරාලිය යුතුය:

- ඔබගේ විදේශ ගමන, ආධාර ලබාදීම ඇතුළු කෝවිඩ්-19 ව්‍යාප්තියේ ප්‍රතිචාරයක කොටසක් නම්
- ඔබගේ විදේශ ගමන තීරණාත්මක කර්මාන්ත සහ ව්‍යාපාර පැවැත්වීමට අත්‍යාවශ්‍ය නම් (ආනයන සහ අපනයන කර්මාන්ත ඇතුළුව)
- ඕස්ට්‍රේලියාවේදී ලබාගත නොහැකි හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ඔබ විදේශයකට යන්නේ නම්
- ඔබ හදිසි සහ නොවැළැක්විය හැකි පුද්ගලික ව්‍යාපාර සම්බන්ධයෙන් විදේශයකට යන්නේ නම්
- සානුකම්පිත හෝ මානුෂික පදනම් මත යන්නේ නම්
- ඔබගේ විදේශ ගමන ජාතික අවශ්‍යතාවයක් සඳහා නම්.

ඔබගේ ඉල්ලීම සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත්කල යුතු අතර ඒවා අතර පහත දේ තිබිය හැකිය:

- ගමන් බලපත්‍රය/බලපත්‍ර
- විවාහ සහතිකය/සහතික
- උප්පැන්න සහතිකය/සහතික
- මරණ සහතිකය/සහතික
- සම්බන්ධතාවය පිළිබඳ සාක්ෂි (උදාහරණ වශයෙන්, හවුලේ ඇති කුලී ගිවිසුම, හවුල් බැංකු ගිණුම ආදිය)
- බදු ගිවිසුම්, රැකියා ලබාදීම්, සහ ඔබගේ භාණ්ඩ ප්‍රවාහනය කරන බවට සාක්ෂි ආදී ඔබ වෙනත් රටකට දීර්ඝ කාලයකට යන බවට සාක්ෂි
- ඔබගේ ඕස්ට්‍රේලියාවේ සහ/හෝ විදේශ ඇතුළු වර්තමාන වලංගු වීසා බලපත්‍ර සම්බන්ධ සාක්ෂි
- විදේශ ගමන අවශ්‍යවීමට හේතුව ඇති ප්‍රකාශන සහිත වෛද්‍යවරයා හෝ රෝහල වෙතින් ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර/අසනීප තත්වය ඇතුලත් ලිපියක්
- විදේශ ගමන අවශ්‍ය බව පෙන්වන හෝ ඔබ විසින් ඉටුකරන රාජකාරීවල තීරණාත්මක වැදගත් බව පෙන්වන සේවායෝජකයාගෙන් ලබාගත් ලිපියක්
- ඔබ නැවත ඕස්ට්‍රේලියාවට පැමිණීමට අදහස් කරන බවට පෙන්වන ප්‍රකාශයක් හෝ සාක්ෂි
- ඔබගේ ඉල්ලීමට සහාය ලබාදෙන වෙන කිසියම් සාක්ෂි.

**ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමකට අදාල සියළුම සාක්ෂි නිල වශයෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර තිබිය යුතුය.**

**බැහැර කිරීමට අයදුම් කිරීම, සැලසුම් කල ගමනට අවම වශයෙන් සති 4 කට පෙර සහ මාස 3 කට වැඩි නොවන කාලයක් තුල කල යුතුය.**

**ඔබට බැහැර කිරීමක් ලබා දුන්නේ නැතිනම්, ඔබගේ ගමන් සැලසුම අනුව කටයුතු නොකල යුතුය. ඔබට බැහැර කිරීමක් ප්‍රදානය කලහොත්, ගුවන් තොටුපලට එම බැහැර කිරීමේ තීරණය සම්බන්ධ සාක්ෂි රැගෙන යා යුතුය.**

පහත අවස්ථාවල ඔබ බැහැරවේ:

- ඔබ ඕස්ට්‍රේලියාව හැර වෙනත් රටක සාමාන්‍ය වශයෙන් පදිංචිවී සිටින අයෙකු නම්
- ගුවන් සමාගම් සහ නෞකා කාර්ය මණ්ඩල සහ එයට ආශ්‍රිත අරක්ෂක සේවකයන්
- විශේෂ කාණ්ඩ (උපකාණ්ඩ 444) වීසා බලපත්‍රයක් දරණ නවසීලන්ත පුරවැසියෙක්
- රටට පැමිණෙන සහ රටින් ඉවතට යන භාණ්ඩ ප්‍රවාහනයේ යෙදී සිටින අය
- එතෙර පහසුකම්වල අත්‍යාවශ්‍ය සේවාවල කටයුතු කරන අය
- ඕස්ට්‍රේලියානු ආරක්ෂක බලකායේ සාමාජිකයන් ඇතුළු රජයේ නිල කටයුතු සම්බන්ධයෙන් ගමන් කරන අය

පසුගිය මාස 12 සිට 24 කාලයක් තුල ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත කාලය ගතකර ඇති බව ජාත්‍යන්තර ගමන් වාර්තා (international movement records) අනුව පෙන්වයි නම්, ඔබ ඕස්ට්‍රේලියාව හැර වෙනත් රටක සාමාන්‍ය නේවාසිකයෙක් වශයෙන් සලකනු ලබයි. ඔබගේ ගමන් විස්තරය සම්බන්ධ සාක්ෂි ඔබ විසින් රැගෙන යාම අවශ්‍ය නැත. අවශ්‍ය නම්, ඕස්ට්‍රේලියානු දේශසීමා බලකා නිලධාරීන් හට දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙන් ඔබගේ ජාත්‍යන්තර ගමන් වාර්තා පරීක්ෂාකර බැලිය හැකිය.

ඔබ පසුගිය මාස 12 සිට 24 ඇතුලත ඕස්ට්‍රේලියාවෙන් පිටත ගතකර නැති වුවද, ඔබ වෙනත් රටක සාමාන්‍ය වශයෙන් ජීවත්වන වැසියෙකු වශයෙන් සලකයි නම්, ඔබ විසින් ගමන් සම්බන්ධ බැහැර කිරීමකට ඉල්ලා සිටිය යුතුය.

ඔබගේ ඉල්ලීම සමග සාක්ෂි ඉදිරිපත් කල යුතු අතර, පහත උදාහරණ දැක්විය හැකිය:

- ඔබට ස්ථාපනයවුණු නිවසක් වෙනත් රටක ඇතිබව
- ඔබගේ සමීප ඥාතීන් සිටින තැන
- ඕස්ට්‍රේලියාවෙන් පිටත වැඩ කිරීමට රැකියා ගිවිසුමක්
- යැපෙන දරුවන් සඳහා පාසැල් ඇතුලත් කිරීම්
- දිගින් දිගට පවතින ව්‍යාපාර/දේපළ සම්බන්ධ සාක්ෂි
- ඔබට ද්විත්ව පුරවැසිබව ඇති බව හෝ වෙනත් රටකට වලංගු වීසා බලපත්‍රයක් ඇති බව
- ඔබ වෙනත් රටක නොසිටීම තාවකාලික බව සහ ඔබ එම රටට යාමට අදහසක් ඇති බව පෙන්වන සාක්ෂි

ඔබට ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමක් අවශ්‍ය නැති බවට ඔබ සිතයි නම්, ඔබ ගුවන් තොටුපල වෙත ගිය පසු මෙම සාක්ෂි පෙන්විය හැකිය. කෙසේවුවද, සාමාන්‍ය වශයෙන් වාසිකයෙකු යන අර්ථනිරූපණය සම්බන්ධ සැකයක් ඇතිනම්, ඔබ පිටත්ව යාමට සති හතරකට පෙර ඇගයීම සඳහා අයදුම් පත්‍රයක් යොමු කිරීම අපගේ නිර්දේශයවේ.